| *I වන උපලේඛනය*<br>*ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කරන ලද ව්‍යාපාරයේ විස්තර* | | |
|---|---|---|
| 1. අයදුම්කරුගේ නම | **බ්‍රිජ් ස්ටෝන් ග්ලෝබල් ලිමිටඩ්**<br>**(BRIDGE STONE GLOBAL LIMITED)** | |
| 2. බලයලත් තැනැත්තාගේ බලපත්‍ර අංකය | 2405030066 | |
| 3. බලපත්‍රය නිකුත් කළ දිනය | 2024 ජූලි 05 වන දින | |
| 4. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද, 2025 අංක 1 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගය | |
| 5. ව්‍යාපාරික ක්ෂේත්‍රය | සාමාන්‍ය ව්‍යාපාර<br>තොරතුරු තාක්ෂණ<br>ව්‍යාපාර ක්‍රියාවලි බාහිරින් ලබා ගැනීම (BPO) සහ දරන්නා වූ සමාගම (holding company) | |
| 6. අපේක්ෂිත විදේශ ආයෝජන ලැබීම් (එ.ජ. ඩොලර්) | වර්ෂය 1 | 2,000,000 |
| | වර්ෂය 2 | 1,500,000 |
| | වර්ෂය 3 | 1,500,000 |
| | වර්ෂය 4 | - |
| | වර්ෂය 5 | - |
| 7. අපේක්ෂිත රැකියා අවස්ථා (සංඛ්‍යාව) | වර්ෂය 1 | 20 |
| | වර්ෂය 2 | 70 |
| | වර්ෂය 3 | 120 |
| | වර්ෂය 4 | 140 |
| | වර්ෂය 5 | 170 |
| 8. වාණිජ කටයුතු ආරම්භ කිරීම (දිනය) | මෙම ගැසට් නියෝගය ප්‍රකාශයට පත්කළ දිනයෙන් මාස 03 කින් | |

### *II වන උපලේඛනය*
### *ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු*

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 (5) වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

බ්‍රිටිෂ් වර්ජින් අයිලන්ඩ්ස් හි ලියාපදිංචි සමාගමක් වන බ්‍රිජ් ස්ටෝන් ග්ලෝබල් ලිමිටඩ් (Bridge Stone Global Limited), විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ඕනෑම ප්‍රමාණයක ව්‍යාපාර සඳහා ව්‍යාපාරික ක්‍රියාවලි බාහිරින් ලබාදීමේ සේවා (BPO) සහ පසුකාර්යාලීය සහායක සේවා සැපයීම සම්බන්ධයෙන් විශේෂඥතාවක් දක්වනු ඇත. සේවාලාභීන්ගේ මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම මගින් ඔවුන්ට තම මූලික නිපුනතා කෙරෙහි අවධානය යොමු කිරීමට ඉඩ සැලසීම සඳහා කාර්යක්ෂමතාව, පිරිවැය-ඵලදායීතාව සහ ගුණාත්මකභාවය කෙරෙහි මෙම සමාගම සිය අවධානය යොමු කරයි. ඔවුන් සපයන සේවාවන් අතර පාරිභෝගික සහාය සේවා, දත්ත ඇතුළත් කිරීම, පරිපාලනමය කාර්යයන් සහ තොරතුරු තාක්ෂණ සහායක සේවා ඇතුළත් වේ. දියුණු තාක්ෂණය සහ දක්ෂ ශ්‍රම බලකායක් උපයෝගී කරගනිමින්, බ්‍රිජ් ස්ටෝන් ග්ලෝබල් ලිමිටඩ් සෑම සේවාලාභියෙකුගේම අනන්‍ය අවශ්‍යතාවලට ගැළපෙන විසඳුම් ලබා දෙයි. දකුණු ආසියාව, මැදපෙරදිග සහ නැගෙනහිර ආසියාව සමාගමේ මූලික ඉලක්කගත වෙළඳපලවල් වන අතර, එමගින් ව්‍යාපාරවලට සිය සේවාලාභීන් වෙත කාර්යක්ෂම සේවාවක් සැලසීමට අවස්ථාව හිමි වේ.

